සැ. යු.  2008.01.25 දින පළකරන ලද අංක 1,534 *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,535 - 2008 පෙබරවාරි මස 01 වැනි සිකුරාදා - 2008.02.01**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 82 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 82 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 පෙබරවාරි මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 ජනවාරි මස 25 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

81 - B 079583 —3,950 (2008/02)
A1–

# ආණ්ඩුවේ නිවේදන

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදු කිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| *අංකය* | *ලියාපදිංචි කිරීමේ දිනය* | *විස්තරය* | *පිහිටීම* | *දේවගැතිතැන, අයිතිකරු හෝ භාරකරු* | *ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද* |
|---|---|---|---|---|---|
| 1412 | 2008.01.07 | ජේසු බිළිඳු දෙව්මැදුර | මැදිකැලේ | ගරු එස්. විජයකුලසූරිය දේවගැතිතුමා | රෝමානු කතෝලික |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
කොළඹ 11,
2008 ජනවාරි මස 10 වැනි දින.

02-73

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය 0205500094.
ණයකරුගේ සම්පූර්ණ නම : වීරසේකර ආරච්චිගේ ජයසේන සහ ලණුහේවගේ මාලනී

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ඒ. කේ. එදිරිසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 5106 හා 2003.11.13 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ දාහතරදහස් එකසිය හැත්තෑ පහයි ශත පනහක් (රු. 114,175.50) මුදලක් වර්ෂ 2006.08.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූ අටදහස් එකසිය හැත්තෑ හතයි ශත විසිහතක (රු. 98,177.27) මුදලද, වර්ෂ 2006.08.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් පහළොස්දහස් නවසිය අනූඅටයි ශත විසිතුනක් (රු. 15,998.23) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ දාහතරදහස් එකසිය හැත්තෑ පහයි ශත පනහක් (රු. 114,175.50) ද,

(2) එකී රුපියල් අනූ අටදහස් එකසිය හැත්තෑ හතයි ශත විසිහතක (රු. 98,177.27) මුදල මත අයවිය යුතු වර්ෂයකට 9.50% බැගින් වන පොළියක් 2006.09.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006 ක් වූ ඔක්තෝබර් මස 26 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මැද පත්තුවේ සියනෑ කෝරළේ ගම්පහ ප්‍රාදේශීය සභා සීමාවේ හෙනරත්ගොඩ උප කාර්යාලයේ

ගල්ලොළුව ග්‍රාමයේ 1 වැනි පටුමගේ නැදුන්ගමුව පාරේ වරිපනම් අංක 42 හි පිහිටි මිල්ලගහවත්ත නැමැති ඉඩමට 1999.10.15 දින එල්. ජේ. ලියනගේ මානක තැන විසින් මැන සම්පාදිත අංක 7996 පිඹුර ප්‍රකාර ලොට් 4ඒ ට මායිම් උතුරට පියරත්න සේනාධීරගේ ඉඩමෙහි කොටසක් ද, නැගෙනහිරට පාර (පිඹුරු අංක 2220 හි ලොට් 3) එම පිඹුරේම ලොට් 4 බී ද, දකුණට එම පිඹුරේම ලොට් 4 බී ද , බටහිරට පියරත්න සේනාධීරගේ ඉඩමෙහි කොටසක් ද, යන මායිම් තුළ පිහිටි පර්චස් හයයි දශම අටක් (අක්. 0, රූඩ්. 0, පර්. 6.8) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවයද සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E584/5 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-123

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය 0100002729.
ණයකරුගේ සම්පූර්ණ නම : ජාමුණි සිරිල් පෙරේරා

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. ඩබ්ලිව්. ගුණසේකර විසින් ලියා සහතික කරන ලද අංක 549 හා 1994.02.01 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පනස්පන්දහස් අටසිය හතළිස්නවයයි ශත අසූනවයක (රු. 155,849.89) මුදලක් වර්ෂ 2007.04.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් පනස්හතරදහස් හත්සිය පහළොවයි ශත තිස්පහක (රු. 54,715.35) මුදලද, වර්ෂ 2007.04.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් එක්ලක්ෂ එක්දහස් එකසියතිස්හතරයි ශත පනස්හතරක් (රු. 101,134.54) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ පනස්පන්දහස් අටසිය හතළිස්නවයයි ශත අසූනවයක් (රු. 155,849.89) ද,

(2) එකී රුපියල් පනස්හතරදහස් හත්සිය පහළොවයි ශත තිස්පහක (රු. 54,715.35) මුදල මත අයවිය යුතු වර්ෂයකට 20.50% බැගින් වන පොළියක් 2007.05.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007 ක් වූ මැයි මස 30 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගලහිටියාව ප්‍රාදේශීය සභා සීමාවේ, ගලහිටියාව ග්‍රාමයේ, දෙල්ගහවත්ත නැමැති ඉඩමට 1992.11.24 දින එස්. සමරවික්‍රම මානක තැන විසින් මැන සම්පාදිත අංක 335/1992 පිඹුර ප්‍රකාර ලොට් A1ට මායිම්, ඊසානට පාර (බටුවත්ත සිට ගණේමුල්ල දක්වා දිවෙන) ද, ගිණිකොණට ලොට් A2 (අඩි 06 පළල ප්‍රවේශ මාර්ගය) ද, නිරිතට අංක 880A පිඹුරේ දැක්වෙන ලොට් A දරන ආර්. එල්. පීරිස් හිමිකම් කියන ඉඩම ද, වයඹට ඩබ්ලිව්. ඒ. පොඩිසිංඤෝ හිමිකම් කියන ඉඩම ද, යන මායිම් තුළ පිටිහි පර්චස් එකොළහයි දශම හතයි තුනක (අක්. 0, රූඩ්. 0, පර්. 11.73) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද, මාර්ග පරවශතාවය ද සමග ගම්පහ ඉඩම් ලියාපදිවි කිරීමේ කාර්යාලයේ B299/84 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-122

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

### (කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය 0400001672.
ණයකරුගේ සම්පූර්ණ නම : අරඹයලාගේ ශ්‍රියානි සුමිත්‍රා

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. සී. රත්නායක විසින් ලියා සහතික කරන ලද අංක 3203 හා 2006.01.03 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය

සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් පන්ලක්ෂ පනස්දෙදහස් හයසිය පනස්හයයි ශත තිස්දෙකක (රු. 552,656.32) මුදලක් වර්ෂ 2006.11.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හාරලක්ෂ අනූඅටදහස් හත්සිය තිස්තුනයි ශත හතලිස්පහක (රු. 498,733.45) මුදලද, වර්ෂ 2006.11.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් පනස්තුන්දහස් නවසිය විසිදෙකයි ශත අසූහතක් (රු. 53,922.87) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් පන්ලක්ෂ පනස්දෙදහස් හයසිය පනස්හයයි ශත තිස්දෙක (රු. 552,656.32) ද,

(2) එකී රුපියල් හාරලක්ෂ අනූඅටදහස් හත්සිය තිස්තුනයි ශත හතලිස්පහක (රු. 498,733.45) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.00% බැගින් වන පොළියක් 2006.12.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උප ලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006 ක් වූ දෙසැම්බර් මස 29 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාවේ, සුදුහුම්පොල ග්‍රාමයෙහි සුදුහුම්පොල විහාර පාරේ වරිපනම් අංක 93/54 හි පිහිටි ගුරුන්නාන්සේලාගේ හේන *හෙවත්* ගලබැඳිතැන්න නැමැති ඉඩමට 2004.07.25 දින ජී. පුංචිහේවා මානක තැන විසින් සම්පාදිත අංක 2421/P පිඹුර ප්‍රකාර 2004.09.16 දින ටී. බී. අත්තනායක මානක තැන විසින් මැන සම්පාදිත උප බෙදුමක් වන ලොට් 1A ට මායිම්, උතුරට ලොට් 1 B ද, නැගෙනහිරට ලොට් 2 ද, දකුණට කඳුර ද, බටහිරට නිවෙස්හි සිට ප්‍රධාන පාර දක්වා වූ පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනක (අක්. 0, රූඩ්. 0, පර්. 13) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලුදේද, මාර්ග පරවශතාවය ද සමග මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 338/216 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-124

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථාව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0200002165
ණයකරුගේ සම්පූර්ණ නම : හෙට්ටිආරච්චිගේ රුක්මන්

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් බී. පී. ඩී. සී. කරුණාරත්න විසින් ලියා සහතික කරන ලද අංක 594 හා 2001.06.25 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ පනස්දහස් හත්සිය තිස්නමයයි ශත පනස්අටක (රු. 150,739.58) මුදලක් වර්ෂ 2007.04.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

1. එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ දෙදහක (රු. 102,000.00) මුදලද, වර්ෂ 2007.04.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතළිස්අටදහස් හත්සිය තිස්නවයයි ශත පනස්අටක් (රු. 48,739.58) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ පනස්දහස් හත්සිය තිස්නවයයි ශත පනස්අටක් (රු. 150,739.58) ද,

2. එකී රුපියල් එක්ලක්ෂ දෙදහක (රු. 102,000.00) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.50% බැගින් වන පොළියක් 2007.05.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

3. එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රධානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථාව බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007 ක් වූ මැයි මස 30 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමාවේ, මුන්ගමුව ග්‍රාමයෙහි පිහිටි කීනවලකැලේ *නොහොත්* කොට්ටලලන්ද දැනට සිසිල් සෙවන නැමැති ඉඩමට 1999.03.09 දින එස්. සෙනරත් මානක තැන විසින් මැන සම්පාදිත

අංක 675 පිඹුර ප්‍රකාර ලොට් 26 ට මායිම්, උතුරට : ලොට් 25 ද, නැගෙනහිරට :ලොට් 64 ද, දකුණට :ලොට් 27 ද, බස්නාහිරට :ලොට් 28 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම දෙකක (අක්. 0, රූඩ්. 0, පර්. 15.2) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 643/23 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-127

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 09/0/00/00163.
ණයකරුගේ සම්පූර්ණ නම : ටෙන්සන් දන්තනාරායන.

අම්බලන්තොට ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. විජේසූරිය විසින් ලියා සහතික කරන ලද අංක 1453 හා 1997.11.15 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ තිස් අටදහස් පන්සිය පනහයි ශත අටක (රු. 1,38,550.08) මුදලක් වර්ෂ 2003.02.28 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්,

1. එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ තුන්දහස් දෙසිය හැත්තෑදෙකයි ශත විසිහතරක (රු. 1,03,272.24) මුදලද, වර්ෂ 2003.02.28 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්පන්දහස් දෙසිය හැත්තෑහතයි ශත අසූහතරක් (රු. 35,277.84) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ තිස්අටදහස් පන්සිය පනහයි ශත අටක් (රු. 1,38,550.08) ද,

2. එකී රුපියල් එක්ලක්ෂ තුන්දහස් දෙසිය හැත්තෑදෙකයි ශත විසිහතරක (රු. 1,03,272.24) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.00% බැගින් වන පොළියක් 2003.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

3. එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ජී. පී. ආනන්ද යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවාපත්තුවේ පුවක්දණ්ඩාව ග්‍රාමයේ පිහිටි සිත්තරාගේවත්ත නමැති ඉඩමට 1994.09.07 දින ටී. එච්. ජීවානන්ද මානක තැන විසින් මැන සම්පාදිත අංක 1994/36 පිඹුර ප්‍රකාර ලොට් 02ට මායිම්, උතුරට: ජයතුගේ ඉඩම *නොහොත්* වඩුගෙදර ද, නැගෙනහිරට: බෙදූ ලොට් 1 ද, දකුණට: ලොට් 10 (පාර) ද, බටහිරට: බෙදූ ලොට් 3, 4 හා ලොට් 10 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් තිස් අටයි දශම හයක් (අක්. 0, රූ. 0, පර්. 38.6) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද, සමග තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ්. 174/151 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2003 ක් වූ 04 මස 29 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-126

---

LE/RE/201.

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0200001573.
ණයකරුගේ සම්පූර්ණ නම : වික්‍රමසිංහ අප්පුහාමිලාගේ ඩික්සන් ශාන්ත වීරවර්ධන.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. එස්. ආර් අමරසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 471 හා 2000.01.20 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංකය 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ හතළිස්හයදහස් අනූඑකයි ශත දහඅටක (රු. 4,46,091.18) මුදලක් වර්ෂ 2007.04.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

01. එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ අනූදහස් හයසිය හතළිස්පහයි ශත පහක (රු. 2,90,645.05) මුදල ද, වර්ෂ 2007.04.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් එක්ලක්ෂ පනස්පන්දහස් හාරසිය හතළිස්හයයි ශත දහතුනක් (රු. 1,55,446.13) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හාරලක්ෂ හතළිස්හයදහස් අනූඑකයි ශත දහඅටක් (රු. 4,46,091.18) ද,

02. එකී රුපියල් දෙලක්ෂ අනූදහස් හයසිය හතළිස්පහයි ශත පහක (රු. 290,645.05) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.87% බැගින් වන පොළියක් 2007.05.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

03. එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007 ක් වූ 05 මස 30 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාවේ, බටේපොල ග්‍රාමයෙහි පිහිටි මිල්ලගහවත්ත *හෙවත්* ගලේවත්ත *හෙවත්* ගල්පට්ටෙවත්ත නමැති ඉඩමට 1998.08.13 දින කේ. ටී. පී. ආර්. අහුගම්මන මානක තැන විසින් මැන සම්පාදිත අංක 61/1998 පිඹුර ප්‍රකාර ලොට් 1 ට මායිම්, උතුරට: අභාවප්‍රාප්ත ඉසෝහාමි සහ බාරංචි අප්පුගේ ඉඩම සහ කුඹුර ද, නැගෙනහිරට: අභාවප්‍රාප්ත ඉසෝහාමි සහ බාරංචි අප්පුගේ ඉඩම සහ ලොට් 2 ද, දකුණට: ලොට් 2 සහ 3 ද, බස්නාහිරට: ලොට් 3 සහ කුඹුර ද, යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් තිහයි දශම නවයයි තුනක (අක්. 0, රූඩ්. 1, පර්. 30.93) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේ ද මාර්ග පරවශතාවය ද සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 540/14 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-120

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 22/0/33/00008.
ණයකරුගේ සම්පූර්ණ නම : රාජසිංහ මුදියන්සෙලාගේ සුනිල් පියරත්න.

බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද විසින් ලියා සහතික කරන ලද අංක 3060 හා 1994.10.25 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු සංස්ථාව යනුවෙන් හඳුන්වනු ලබන 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස්කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ තිස් තුන්දහස් දෙසිය තිස් එකයි ශත තිස් එක (1,33,231.31) ක මුදලක් වර්ෂ 2002.08.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවට ලැබිය යුතුව ඇති හෙයින්,

1. එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අසූ අටදහස් අටසිය පනස් එකයි ශත හැට එක (88,851.61) ක මුදල ද වර්ෂ 2002.08.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතළිස් හතරදහස් තුන්සිය හැත්තෑ නවයයි ශත හැත්තෑව (44,379.70) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ තිස් තුන්දහස් දෙසිය තිස් එකයි ශත තිස් එක (1,33,231.31) ද,

2. එකී රුපියල් අසූ අටදහස් අටසිය පනස් එකයි ශත හැට එක (රු. 88,851.61) ක මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.00% බැගින් වන පොළියක්, 2002.09.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

3. එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. ජයතිලක යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ මහ නගර සභා සීමාවේ මැදවෙලගම පිහිටි වරිපනම් අංක 37 දරන ඉහළ අලුත් ඇල පාරේ 'තොලබෝගස්වත්ත' නමැති ඉඩමෙන් එම්. කේ. සී. ප්‍රේමචන්ද්‍ර මානකතැන විසින් 1992.03.20 දින මැන සම්පාදිත පිඹුරු අංක 2355 ප්‍රකාර කැබලි අංක 01 බිම් කැබැල්ලට මායිම් උතුරට: පාර ද, නැගෙනහිරට: ඩබ්. එම්. බණ්ඩාර මැණිකෙට අයත් වත්ත ද, දකුණට: ආර්. ඒ. පොඩිමහත්තයාට අයත් වත්ත ද සහ බටහිරට: ඒ. එම්. රොසලින් නෝනාට අයත් වත්ත ද යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයක (අක්. 0, රූ. 0, පර්. 6) වපසරියකින්

යුත් බිම් කැබැල්ල වේ. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 65/107 ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2002 ක් වූ 09 මස 27 දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-125

---

LE/RE//201.

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0200001967.
ණයකරුගේ සම්පූර්ණ නම : ඉරෝමි ඉන්දිකා ෆෙයාර්වෙදර්.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. එස්. කේ. ජයසේකර විසින් ලියා සහතික කරන ලද අංක 614 හා 2000.12.05 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ අනූහත්දහස් හයසිය විසිපහයි ශත හැට නවයක (රු. 197,625.69) මුදලක් වර්ෂ 2007.04.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

01. එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අනූහතර දහස් තුන්සිය දහනවයයි ශත පනස් හතක (රු. 1,94,319.57) මුදල ද, වර්ෂ 2007.04.30 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් තුන්දහස් තුන්සිය හයයි ශත දොළහක් (රු. 3,306.12) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ අනූහත්දහස් හයසිය විසිපහයි ශත හැට නවයක (රු. 1,97,625.69) ද,

02. එකී රුපියල් එක් ලක්ෂ අනූහතර දහස් තුන්සිය දහනවයයි ශත පනස් හතක (රු. 1,94,319.57) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15% බැගින් වන පොළියක් 2007.05.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

03. එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007 ක් වූ 05 මස 30 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මැදපත්තුවේ සියනෑ කෝරළේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාවේ, අළුත්ගම බෝගමුව ග්‍රාමයෙහි පිහිටි කීනගහලන්ද නමැති ඉඩමට 1989.09.14 දින ආර්. ඒ. චන්ද්‍රරත්න මානක තැන විසින් මැන සම්පාදිත අංක 3787 පිඹුර ප්‍රකාර ලොට් එෆ් 14 ට මායිම්, ඊසානට ලොට් එෆ් 12 ද, ගිණිකොණට: එම ඉඩමේම කොටසක් (ලොට් වයි) ද, නිරිතට: මාර්ග රක්ෂිතය (අඩි 3ක් පළල) ද, වයඹට: ලොට් එෆ් 15, එෆ් 13, සහ එෆ් 7 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහක් (අක්. 0, රූඩ් 0, පර්. 12) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශතාවය ද සමඟ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ටී 598/60 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

02-121

---

**සෙලාන් බැංකුව පීඑල්සී**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.07.18 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශාඛාව: කුරුදුවත්ත.
ගිණුම් අංකය : 0320-601823-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත.)ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එන්. රාජකරුණා විසින් සහතික කරන ලද 2001

ජනවාරි 26 දිනැති අංක 786 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 10 හි සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ලියාපදිංචි අංක එන්(පීවීඑස්) 6562 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන හියට් ස්ටීල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහනවලක්ෂ හතලිස් හතර දහස් පනස් හතයි ශත එකක් (රු.19,44,057.01) මුදලක්, 2005 ජනවාරි 31 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 19,44,057.01 මුදල ද, 2005 පෙබරවාරි 1 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් දෙක (32%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබ ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 786 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, ගඟබඩ පත්තුවේ, පැලහැල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. එම්. ජලල්දීන් විසින් සාදන ලද 1995 ජුනි 8 දිනැති අංක 2311 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මඩුගහවත්ත නමැති ඉඩමේ කැබැලි අංක 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට: දැන් කේ. ඩී. ඒ. ගුණරත්නට හිමි මඩුගහවත්ත ද, නැගෙනහිරට : දැන් කේ. ඩී. ඒ. ගුණරත්නට හිමි මඩුගහවත්ත සහ කලින් සමරදිවාකරට හිමි දැන් කේ. ඩී. කේ. ගුණරත්නට හිමි අඹගහඕවිට, දකුණට: ලොට් 2, මෙම මිනින්දෝරු තැන විසින් සාදන ලද 1990.09.20 දිනැති අංක 2036 දරන සැලැස්මේ සඳහන් ලොට් 2 සහ මෙම මිනින්දෝරු තැන විසින් සාදන ලද 1995.03.29 දිනැති අංක 2308 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 1 සහ බස්නාහිරට පෙර කී අංක 2308 දරන සැලැස්මේ සඳහන් කැබැලි අංක 1 පාර සහ දැන් කේ. ඩී. ඒ. ගුණරත්නට හිමි මඩුගහවත්ත ද, යන මායිම් තුළ එකී අංක 2311 දරන සැලැස්ම අනුව රූඩ් තුනයි, පර්චස් තිස් එකයි දශම හතරයි බිංදුවක් (අක්කර 0, රූඩ් 3, පර්චස් 31.40) *නොහොත්* (හෙක්ටයාර් 0.3831) විශාල, බිම, ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම, මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඩී 228/228 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

02-81/1

### සෙලාන් බැංකුව පීඑල්සී

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.07.09 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශාඛාව : බොරලැස්ගමුව.
ගිණුම් අංකය: 0340-372957-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත.)ප්‍රසිද්ධ නොතාරිස් එස්. එස්. ද ලිවේරා විසින් සහතික කරන ලද 1997 මැයි 19 දිනැති අංක 662, ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එස්. පීරිස් විසින් සහතික කරන ලද 1997 නොවැම්බර් මස 28 දිනැති අංක 371 සහ 1999 මැයි 19 දිනැති අංක 1774 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 6, වැල්ලවත්ත ලියාපදිංචි අංක ඩබ්ලිව්/ඒ 35008 දරන ඒන්ජල් ඇක්වේරියම් යන නාමය විලාශය සහ අභිධානය යටතේ දෙදෙනාම හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන වර්ණපුරගේ මිහිරි ට්‍රිරාන් ප්‍රනාන්දු සහ රොහාන් ලෙනාඩ් ප්‍රනාන්දු යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් හැට හතර ලක්ෂ අනූදෙදහස් නවසිය පනස් හයක (රු.64,92,956.00) මුදලක්, 2007 ජනවාරි 31 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් 64,92,956.00 මුදල ද, 2007 පෙබරවාරි මස 1 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 662, 371 සහ 1774 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේපත්තුවේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ තුම්බෝවිල පිහිටි බලයලත් මිනින්දෝරු හෙක්ටර් වීරතුංග විසින් සාදන ලද 1996 අගෝස්තු 22 දිනැති අංක 208 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මරක්කලවත්ත, මරක්කලයාඕවිට සහ මරක්කලයා කුඹුර නමැති ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ කැබලි අංක 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට: රොහාන් එල්. ප්‍රනාන්දු හිමිකම් කියනු ලබන ඒන්ජල් ෆිෂ් පාම් එක ද, නැගෙනහිරට: වේරහැර සිට ප්‍රධාන පාරට ඇති කරත්ත පාර ද, දකුණට: ගයන්ත්‍රී ගුණතිලක විසින් හිමිකම් කියනු ලබන අංක 10 ක දියන පාර සහ බස්නාහිරට: රොහාන් එල්. ප්‍රනාන්දු හිමිකම් කියනු ලබන ඒන්ජල් ෆිෂ් ෆාම් එක ද යන මායිම් තුළ එකී අංක 208 දරන සැලැස්ම අනුව රූඩ් එකයි, පර්චස් විසි එකයි දශම හයයි හයක් (අක්කර 0, රූඩ් 1, පර්චස් 21.66) විශාල ඉඩම. මෙය

කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එම් 2211/205 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - නීති.

02-81/2

---

**රුහුණ සංවර්ධන බැංකුව -අගුණකොළපැලැස්ස ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර,

2006.05.16 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන මහතා විසින් සහතික කරන ලද 2003.09.22 දිනැති අංක 6362 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අගුණකොළපැලැස්ස, යකාගල, "විමල්" නිවස පදිංචි ගමගේ සයිමන් සහ අගුණකොළපැලැස්ස, ජඳුරපාර, හැලේකඩ, "වෙද මැදුර" පදිංචි චන්න ලලිත් ගමගේ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් අසූනවදහස් තුන්සියයක (රු.89,300) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2004.12.17 දින සිට වර්ෂයකට 15% බැගින් රුපියල් අසූනවදහස් තුන්සියය (රු.89,300) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 6362 දරන උකස්කරය යටතේ බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

**උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර**

දකුණු පළාතේ, හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, අගුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැගෙනහිර ගිරුවාපත්තුවේ, හැලේකඩ දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ හෙලකඩගල නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අගපි 335/1 දරන පිඹුරේ අංක 73 දරන ඉඩම් කැබැල්ලට මායිම්,

උතුරට - අංක 69 දරන ඇල රක්ෂිතය සහ 75 දරන බිම් කට්ටිය ද,
නැගෙනහිරට - අංක 47 දරන ඇල රක්ෂිතය සහ 75 දරන බිම් කට්ටිය ද,
දකුණට - අංක 74 දරන ඇල රක්ෂිතය සහ 72 දරන බිම් කට්ටිය ද,
බස්නාහිරට -අංක 69 දරන ඇප රක්ෂිතය සහ 72 දරන බිම් කට්ටියද යන සතර මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම පහයි අටයි එකක් (හෙ. 0.581) ක් විශාල ඉඩම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගස්කොළන් පළතුරු ආදී සෑම සියළුදේත්, එකී ඉඩමට යාම ඊම සඳහා ඇති මාර්ගයන්හි මාර්ග අයිතිය ද වේ.

මෙම දේපළ හම්/72/3392/99 දින තංගල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ජේ. රත්නායක,
සභාපති.

රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන,
මාතර.

02-01/1

---

**රුහුණ සංවර්ධන බැංකුව - හක්මන ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුනු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති විශේෂ *ගැසට් නිවේදනයට* අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර,

2007.10 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී.

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් චන්ද්‍රකුමාර විජේගුණවර්ධන මහතා විසින් සහතික කරන ලද 2005.09.26 දිනැති අංක 18677 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පුහුල්වැල්ල, හෙට්ටියාවල, නිර්මල ලිපිනයේ පදිංචි, කොඩිතුවක්කුගේ සුනිල් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දෙලක්ෂ පනස්එක්දහසක (රු. 251,000) මුදලක් රුහුන සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින්ද, 2007.02.08 දින සිට වර්ෂයකට 12.5% බැගින් රුපියල් දෙලක්ෂ පනස්එක්දහසක රු. 251,000 මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි විදයදම් ද සමග අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් , ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 18677 දරන උකස්කරය යටතේ බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### උකස් කර ඇති දේපල පිළිබඳ විස්තර

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගඟබඩපත්තුවේ හෙට්ටියාවල පිහිටි මහහේන *හෙවත්* නුගේගොඩහේන සහ හින්ආරෙදෙනිය නැමැති ඉඩමෙන් සර්වේ ජනරාල් විසින් මැන සාදන ලද අංක 429 දරන සැලැස්මේ කැබැලි අංක 01 ට මායිම් උතුරට : ටී. පී. 236393, ටී. පී. 173926, ටී. පී. 236393, ටී. පී. 173925 , ටී. පී. 173926 සහ ටී. පී. 4043 හි කැබලි අංක V 431 ද, නැගෙනහිරට : පී. පී. අංක 51/42, දකුණට : ටී. පී. 160220 හි ගලේවෙල කනත්ත ඉඩම, ටී. පී. 173926, ටී. පී. 173928 සහ ටී. පී. 239643 ද, බස්නාහිර : මරක්කලහේන නැමැති ඩබ්ලිව්. වික්‍රමසිංහට අයත් ඉඩම සහ වැලිකොනහේන නැමැති ඉඩමද, යනමෙහි තුළ අක්කර නවයකුත්, රූඩ් එකකුත්, පර්චස් එකක් (අ. 09, රූ. 01, පර්. 01) ක් විශාල ඉඩමේ සියලු ගහකොළ, පළතුරු සමග බිම සහ එහි පිහිටි සියලු දේ ද වේ.

මෙම දේපල C 495/289/වංවල 35/156 යටතේ 2005.09.26 දින මාතර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ජේ. රත්නායක,
සභාපති.

2007 ඔක්තෝබර් මස
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන,
මාතර.

02-01/2

---

### රුහුණ සංවර්ධන බැංකුව - අගුණකොළපැලැස්ස ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර,

2006.03.29 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී :

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. අමරසේන මහතා විසින් සහතික කරන ලද 2004.06.04 දිනැති අංක 7033 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම තංගල්ල, උස්වැව, මැදආර, ජී 66 හි පදිංචි පතිරණ ගමගේ සිරිසේන පතිරණ අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතලිස් දහසක (රු.2,40,000) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2004.09.15 දින සිට වර්ෂයකට 14.5% බැගින් රුපියල් දෙලක්ෂ හතලිස්දහසක (රු.2,40,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා වෙන්දේසි වියදම් ද සමඟ අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 7033 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තර

දකුණු පළාතේ, හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, අගුණකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදආර නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජනරාල් භාරයේ ඇති සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක අ.ග.පි. 427/6 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 591 දරන ඉඩමට මායිම්,

උතුරට - අංක 607 දරන ඇල රක්ෂිතය ද,
නැගෙනහිරට - අංක 60 දරන ඇල රක්ෂිතය හා 592 දරන ඉඩම ද,
දකුණට- අංක 592 දරන ඉඩම සහ අංක 593 දරන ඇල රක්ෂිතය ද,
බස්නාහිරට -අංක 593 දරන ඇල රක්ෂිතය ද, මායිම් වූ එකී සතර මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් බින්දුවයි දශම දෙකයි තුනයි පහක් (හෙක්ටයාර් 0.235) විශාල ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි, ගස්කොළන්, පළතුරු ආදී සෑම සියළු දේද වේ.

මෙම දේපළ හම්/147/147/200/Aවං. 13/204 යටතේ 2004.06.11 දින හම්බන්තොට ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ජේ. රත්නායක,
සභාපති.

2006 මාර්තු මස 17 වැනි දින,
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන,
මාතර.

02-01/3

# ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

සංශෝධිත ගාස්තු

1995 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ.)

1. සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 9.00 සිට පස්වරු 4.45 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.30 සිට පස්වරු 3.30 දක්වා බව සැලකිය යුතුයි.
5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපෑලෙන් දැන්වී ම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති තැනට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ටයිප් ගසා එවිය යුතුයි. අත් අකුරින් යුතු කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.
7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළායයි හැගෙන ප්‍රකාශන සුප්‍රිම් උසාවියේ පෙරකදෝරු මහතෙකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. 1995 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි.

| | රු. ශ. |
|---|---|
| අගලකට හෝ ඉන් අඩුව | 51 0 |
| වැඩිවන සෑම අගලකටම හෝ ඉන් කොටසකටම | 51 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | 504 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණන ගැසට් පිටුවකටම | 1,008 0 |

(අගලේ සෑම කොටසකටම සම්පූර්ණ අගලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ)

11. සෑම සිකුරාදා දිනයකටම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයකම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියලුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි
13. 1995.01.01 දින සිට සංශෝධිත දායක ගාස්තුව * :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික)

| | මෙරට රු. ශ. | පිටරට රු. ශ. |
|---|---|---|
| I වන කොටස සම්පූර්ණයෙන් (I, II, III ජේද තුනම ඇතුළත්) | 1,612 0 | 2,098 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් | 572 0 | 745 0 |
| I වන ජේදය | 520 0 | 1,007 0 |
| II වන ජේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර්, විභාග ආදිය) | 624 0 | 1,009 9 |
| III වන ජේදය | 468 0 | 907 0 |
| අති විශේෂ ගැසට් පත්‍රය | 3,360 0 | 4,422 0 |

ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ 12 මාසයකට නොඅඩු කාලසීමාවකට පමණය.

* තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ ගාස්තුව රු. ශ. | තැපැල් (මෙරට) රු. ශ. |
|---|---|---|
| (අ) I වන කොටස | 31 0 | 5 0 |
| II වන කොටසේ සිට VI වන කොටස දක්වා එක කොටසක් ක | 11 0 | 5 0 |
| (ආ) I වන ජේදය | 10 0 | 5 0 |
| II වන ජේදය | 12 0 | 5 0 |
| III වන ජේදය | 9 0 | 5 0 |

* දායක මුදල් භාරගැනීම සහ තනිපිටපත් විකිණීම භාර රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියළු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් අංක 132, මායා මාවත, කිරුළපන, කොළඹ 05 පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2008** | | | |
| පෙබරවාරි | 2008.02.01 | සිකුරාදා | 2008.01.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.08 | සිකුරාදා | 2008.01.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.15 | සිකුරාදා | 2008.02.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.22 | සිකුරාදා | 2008.02.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.02.29 | සිකුරාදා | 2008.02.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2008.03.07 | සිකුරාදා | 2008.02.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.03.14 | සිකුරාදා | 2008.02.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.03.19 | බදාදා | 2008.03.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.03.28 | සිකුරාදා | 2008.03.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2008.04.04 | සිකුරාදා | 2008.03.19 | බදාදා | දහවල් | 12.00 |
| | 2008.04.11 | සිකුරාදා | 2008.03.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.04.18 | සිකුරාදා | 2008.04.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2008.04.25 | සිකුරාදා | 2008.04.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.